දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT - UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ද්විතීය භාග (බාහිර) පරීක්ෂණය - 2013 මාර්තු
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) PART II - MARCH 2013

# සිංසා 3.2 - නූතන ප්‍රබන්ධ කථා කලාව
# SLG 3.2 - Modern Fiction

කාලය පැය තුන යි

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න**
**(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.)**

---

## I කොටස

01. "නවකථාව වනාහි ජීවිත නිරූපණය ප්‍රමුඛ කොට ගත් යථාර්ථවාදී නිර්මාණයකි." නිදර්ශන සහිත ව විමර්ශනය කරන්න.

02. "පියදාස සිරිසේනගේ ප්‍රබන්ධකථාවලින් විශද වන්නේ විදේශාධිපත්‍යයේ යදම් බිඳ දැමීමට ඔහු විසින් ගනු ලැබූ අපරිමිත උත්සාහය යි." සාකච්ඡා කරන්න.

03. "සිංහලයේ ප්‍රථම ප්‍රබන්ධකථාව යටත්විජිත කාරකත්වයේ ආධිපත්‍යධාරී ලක්ෂණ ප්‍රසාරණය කිරීමේ අරමුණින් රචිත වූවකි." විමසන්න.

04. නූතන නවකථාවට උචිත වූ විෂය ක්ෂේත්‍රය සකස් වීමෙහි ලා ඩබ්.ඒ. සිල්වාගේ නවකථාවලින් ලද දායකත්වය විමර්ශනය කරන්න.

05. "කෙටිකතාවක මූලික ධාරණාව හෝ අභිප්‍රාය හෝ නිරූපණයෙහි සාර්ථකාසාර්ථකභාවය රඳා පවතින ප්‍රධාන ස්තම්භය භාෂාව යි." නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.

## II කොටස

06. රටක් තුළ නැගී එන කම්කරු සටන් සහ ඔවුන්ගේ සන්ධානගතවීම් මැඩලනුවස් ධනේශ්වර සංස්ථාපිතය මගින් ක්‍රියාත්මක කෙරෙන මර්දනකාරී උපක්‍රම යුගාන්තය නවකථාව ඇසුරෙන් විමර්ශනය කරන්න.

07. චරිත තුනක් නවකථාවෙහි නිරූපිත ඉසාගේ චරිතය පිළිබඳ මනෝවිද්‍යාත්මක විවරණයක් කරන්න.

08. "දක්ෂ කෙටිකතාකරුවා විවිධ සමාජ ස්තරවලට අයත් ප්‍රශ්න නිර්මාණාත්මක ව විග්‍රහ කිරීමට සමත් වෙයි." නිර්දිෂ්ට කෙටිකතා දෙකක් වත් ඇසුරින් මේ මතය සමාලෝචනය කරන්න.

09. "ලෝමාලිකා යනු ආදරය, ලිංගිකත්වය මෙන් ම මිනිසා හා සබැඳි කායික - මානසික ගුණ චරණ පිළිබඳ නිර්මාණාත්මක ප්‍රබන්ධයකි." සාධක සහිත ව පරීක්ෂා කරන්න.

●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●